# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# දෙවන වාරය
# ව්‍යාපාර අධ්‍යයනය - II පත්‍රය - පිළිතුරු
# 13 ශ්‍රේණිය - 2021

**"අ" කොටස**

01. i. අ) ආහාර - එළවළු, පළතුරු
සන්නිවේදනය - Viber, WhatsApp **(ලකුණු 02)**

ආ) 1. ගණුදෙනුකරුවෝ
ව්‍යාපාරයක වැදගත්ම පාර්ශවය ගණුදෙනුකරුවන්ය. අදාළ භාණ්ඩ හෝ සේවා සඳහා වෙළෙඳපොළ සුරක්ෂිත කර ගැනීමට, පාරිභෝගික විශ්වාසය ගොඩනගා ගැනීමට, ගණුදෙනුකරුවන්ගේ පක්ෂපාතීත්වය ඇති කර ගැනීමටත් ගණුදෙනුකරුවන් ව්‍යාපාරයට වැදගත් වේ.

2. සේවකයෝ
ව්‍යාපාරික කටයුතු සාර්ථක කර ගැනීමට සේවකයෝ ද ඉතා වැදගත්ය. ඔවුන් රඳවා ගැනීමට, සේවක ආකර්ශනය ලබා ගැනීමට, සේවක කාර්යක්ෂතාව වැඩි කර ගැනීමට ව්‍යාපාරයට බෙහෙවින් වැදගත් වනු ඇත. **(ලකුණු 02)**

ii. අ) ✶ ප්‍රජා පරිසරයට අයත් සාධකයක් වන ජනගහනය වැඩි වීම නිසා භාණ්ඩ හා සේවා සඳහා ඇති ඉල්ලුම ඉහළ යාමෙන් ව්‍යාපාරවලට අවස්ථා උදාවන අතර ජනගහනය අඩු වීමෙන් නිෂ්පාදිත සඳහා ඇති ඉල්ලුම පහළ යාමෙන් ව්‍යාපාරවලට තර්ජන ඇති වේ.

✶ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ දියුණුව නිසා විද්‍යුත් ව්‍යාපාර කටයුතුවල ව්‍යාප්තියත් සමඟ ව්‍යාපාරවලට අවස්ථා මෙන්ම තර්ජන ද එල්ල වේ.

✶ ආර්ථික පරිසරය යටතේ පොළී අනුපාතය අඩු වීම නිසා ණයගැනීම් වැඩි වී ව්‍යාපාර අවස්ථා උදා වේ. එසේම පොළී අනුපාතය වැඩි වීමෙන් ණය ගැනීම් සීමා වන අතර ව්‍යාපාරවලට තර්ජන වලට මුහුණ දීමට සිදු වේ. **(ලකුණු 02)**

ආ)✶ මැණික් ඉල්ලම් ස්වාභාවික පරිසරයට අයත් වේ. නමුත් එය ව්‍යාපාර කටයුත්තක් බවට පත් කිරීමේදී නීතියේ අවසර ලබා ගැනීමට අවශ්‍යය.

✶ වාණිජ බැංකු විසින් ගණුදෙනුකරුවන්ගේ පහසුව සඳහා නවීන තාක්ෂණික උපකරණයක් වන ටෙලර් යන්ත්‍රයක් සවි කිරීමේදී මහ බැංකුවෙන් අවසර ලබා ගැනීම අවශය වේ. **(ලකුණු 02)**

iii. අ) ✶ ඇතැම් ආහාර පාන වර්ග කල්තබා ගැනීමට ඒවා නිෂ්පාදනයේදී අහිතකර දේ එක් කිරීම.

✶ කල්ඉකුත් වූ ආහාර පාන ඇසුරුම ඉවත්කර නව දින යොදා නැවත වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම. **(ලකුණු 02)**

ආ) ආරක්ෂාව ගැනීමට ඇති අයිතිය, සවන් යොමු කරවා ගැනීමට ඇති අයිතිය, වන්දි ලබා ගැනීමට ඇති අයිතිය හා තොරතුරු දැන ගැනීමට ඇති අයිතිය වැනි පාරිභෝගික අයිතීන් ආරක්ෂා කර ගැනීමට පාරිභෝගිකයා කටයුතු කළ යුතුය. තම වගකම් නොපිරිහෙලා ඉටු කිරීම මඟින් අහිතකර ක්‍රියාකාරකම් වලින් වැළකී සිටිය හැකිය.සක්‍රීය හා විචාරාත්මක දැනුවත්භාවය, සක්‍රීය සහභාගීත්වය සමාජය ගැන සැලකිලිමත් වීම, පරිසරය පිළිබඳ සැලකිලිමත් වීම එම පාරිභෝගික වගකීම් වේ. **(ලකුණු 02)**

iv. අ) ✶ ජලය වාතය හා පස දූෂණය අඩු කිරීම.
✶ ජෛව විවිධත්වය රැකීමට කටයුතු කිරීම.
✶ අපද්‍රව්‍ය කළමනාකරණයේ දී 3R, 4R, 5R යන සංකල්ප භාවිතය.
✶ පරිසර හිතකාමී දේ මිලට ගැනීම.
✶ පාරිසරික නීති වලට අනුගතව කටයුතු කිරීම.
✶ පරිසර හිතකාමී ප්‍රවාහන ක්‍රම භාවිතය.
✶ අන්තරාකාරී ද්‍රව්‍ය සුරක්ෂිතව භාවිතා කිරීම. **(ලකුණු 02)**

ආ) ✶ අත්‍යවශ්‍ය සේවා සැපයීම රජය මගින් කළ යුතු වීම.
උදා:- ජලය, විදුලිය

✶ පුද්ගලික අංශයේ සේවා සැපයීමේ දී ඇතිවන දුර්වලතා මගහරවා ගත හැකි වීම.
උදා:- වෙළෙඳ කටයුතු, ප්‍රවාහනය

✶ සේවා අංශයේ ඉල්ලුම ඉහළ යාම.
උදා:- අධ්‍යාපනය, සෞඛ්‍ය

✶ රජය යටතේ තිබූ නිෂ්පාදන කර්මාන්ත අසාර්ථක වීම නිසා සේවා අංශයට යොමු වීම.
උදා:- සිමෙන්ති සංස්ථාව, පිගන් සංස්ථාව අසාර්ථක වීම

✶ මහජන සුභසාධනය සැපයීම රජයේ කාර්යයක් වීම.
උදා:- නොමිලයේ අධ්‍යාපනය හා සෞඛ්‍ය සේවා සැපයීම **(ලකුණු 02)**

v. අ) ✶ වෙළෙඳපොළ තුළ භාණ්ඩ හා සේවා බහුල වීම.
✶ තරඟකාරීත්වය වැඩි වීම නිසා වෙළෙඳපොළ තුළ විෂමචාර ඇති වීමට ඉඩ වැඩි වීම.
✶ නිදහස් වෙළෙඳාම සමඟ වෙළෙඳපොළ සංකීර්ණ වීම.
✶ ගෝලීයකරණය සමඟ ඇති විය හැකි සමාජ හා සංස්කෘතික පිරිහීම.
✶ පරිසර දූෂණය වීම වැළැක් වීම සඳහා පාරිභෝගිකයින් දැනුවත් කිරීම අවශ්‍ය වේ. **(ලකුණු 02)**

ආ) ✶ අධිකාරිය විසින් නියමකර ඇති ප්‍රමිතියට අනුව නිෂ්පාදනය,සැපයීම, ගබඩා කිරීම, ප්‍රවාහනය හා විකිණීම සිදු කිරීම නිසා නාස්තිය අවම වී ලාභය වර්ධනය වීම.
✶ පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට යොමු වීම නිසා පාරිභෝගික විශ්වාසය දිනා ගැනීමට හැකි වීම.
✶ වෙළෙඳ විෂමාචාර වලින් වැළකී කටයුතු කිරීමෙන් ආයතනයේ ප්‍රතිරූපය වර්ධනය වීම.
✶ ව්‍යාපාරිකයාට මුහුණ දීමට සිදුවන නෛතික තත්ත්වයන් අවම වීම.
✶ ව්‍යාපාර අතර ඇතිවන අනවශ්‍ය තරඟකාරීත්වය අවම වීම.
✶ ඒකාධිකාරී තත්ත්වයන් ඇති නොවීම නිසා සාධාරණව තරග කළ හැකි වීම. **(ලකුණු 02)**

02. i. එකඟ විය නොහැක. **(ලකුණු 01)**
කේවල ස්වාමී ව්‍යාපාරවලට කිසිදු නීතිමය බලපෑමක් නැතැයි කිව නොහැක. ව්‍යාපාර ලියාපදිංචි කිරීම, පරිසර සංරක්ෂණය, පාරිභෝගික ආරක්ෂණය හා සේවක කටයුතු ආදිය සඳහා නීතිමය තත්ත්වයක් පවතී. එමෙන්ම ඔහු තම නමින් හැර වෙනත් නමකින් ව්‍යාපාරය පවත්වා ගෙන යයි නම් එය ලියාපදිංචි කිරීම අනිවාර්යයෙන් කළ යුතු වන නිසා නීතිමය බලපෑමක් ඇති වේ.

ව්‍යාපාර නාම ප්‍රඥප්තිය, ප්‍රමිති ආයතන නීති, ආහාර පාන, සේවක අර්ථසාදක අරමුදල් පනත, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත, පළාත් පාලන ආයතනයෙන් ඇතැම් බලපත්‍ර ලබා ගත යුතු වීම ආදිය කේවල ස්වාමී ව්‍යාපාරයකට ඇති නීති කිහිපයකි. **(ලකුණු 03)**

ii. අ) ව්‍යාපාර නාමය අනුව මින් සී/ස මද්‍ර ෆැෂන් සමාගම ලැයිස්තුගත නොවූ පොදු සමාගමකි. සීමා සහිත කුමුදු ඇපරල්ස් (පොදු) සමාගම ලැයිස්තුගත පොදු සමාගමකි.

මෙම සමාගම් දෙක අතර ප්‍රධාන වෙනස වන්නේ මද්‍ර ෆැෂන් සමාගම මෙන් නොව කුමුදු ඇපරල්ස් සමාගම කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත පොදු සමාගමක් වීමයි. **(ලකුණු 02)**

ආ) ✶ පළාත් සභා, නගර සභා, ප්‍රාදේශීය සභා යටතේ පවත්වාගෙන යාම.
✶ අයිතිය ඒ ඒ පළාත් පාලන ආයතනයට හිමි වීම.
✶ අවශ්‍ය අරමුදල් පළාත් පාලන ආයතන විසින් හෝ මධ්‍යම රජයෙන් සපයනු ලැබීම.
✶ පරිපාලනය පළාත්පාලන අධිකාරීන් විසින් සිදු කිරීම. **(ලකුණු 02)**

iii. අ) ✶ රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල
✶ රාජ්‍ය දෙපාර්තමේන්තු
✶ රාජ්‍ය සමාගම්
✶ පළාත් සභා හා පළාත් පාලන ආයතන යටතේ ඇති ව්‍යාපාර **(ලකුණු 02)**

ආ) ✶ ඒකාධිකාරී ආයතන බිහිවීම වැළැක්වීමට

✶ ජාතියේ ආරක්ෂාව වෙනුවෙන් පවතින යම් යම් ව්‍යාපාර ක්ෂේත්‍ර පවත්වාගෙන යාමට

✶ පොදු ජනතාවට සාධාරණ මිලකට අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා සැපයීමට

✶ පෞද්ගලික අංශය විසින් අහිතකර ලෙස ලාභ ඉපයීම වැනි වෙළෙඳපොළ තත්ත්ව පාලනය කිරීමට

✶ ලාභ නොමැති පෞද්ගලික අංශ අත නොගසන වැදගත් මහා පරිමාණ සංවර්ධන යෝජනා ක්‍රම පවත්වාගෙන යාමට

✶ සම්පත් නාස්තිය අවම කර ගැනීමට **(ලකුණු 02)**

iv. අ) ව්‍යවසායකත්ව සාර්ථකත්වයට බලපා ඇති හේතු සලකා බලා සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න. **(ලකුණු 02)**

ආ) ව්‍යවසායකත්ව නිපුණතා නිශ්චිතව හඳුනා ගැනීම සඳහා එම නිපුණතා තමා තුළ කොතෙක් දුරට පවතී ද, එසේ නොවන ඒවා මොනවාද? යන්න තමාට තක්සේරුවකට පැමිණීම පිළිබඳ තමා විසින්ම ඇගයීමක් සිදු කිරීම ස්වයං ඇගයීම තුළින් සිදු වේ. මෙසේ තමා පිළිබඳ තමාට කරනු ලබන තක්සේරුව තුළින් තම හැකියා හා නොහැකියා පහසුවෙන් හඳුනා ගත හැකි වීමෙන් තව දුරටත් වර්ධනය විය යුතු කුසලතා වර්ධනය කර ගැනීමට පහසු වනු ඇත. **(ලකුණු 02)**

v. අ) කුඩා ව්‍යාපාර අදාළ කර්මාන්තය තුළ පවතින සුළු ප්‍රාග්ධනයක් ආයෝජනය කර ඇති ව්‍යාපාරයන්ය. එමෙන්ම සේවකයන් සුළු පිරිසක් සිටින නිෂ්පාදන ධාරිතාවයද පහළ මට්ටමක පවතින, කුඩා වෙළෙඳපොළ කොටසකට ද හිමිකම් කියයි. එබැවින් මූල්‍යමය ශක්තිය පහළ මට්ටමක පැවතීමත් කර්මාන්තයට බලපෑමක් කිරීමට නොහැකි වීමත් නිසා ක්ෂේත්‍රය තුළ බලයන් හිමි නොවූ ව්‍යාපාර ලෙස මේවා හැඳින්විය හැකිය. **(ලකුණු 02)**

ආ) රටක පවතින ව්‍යාපාර අතරින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වෙනත් ව්‍යාපාර වලින් වෙන්කර හඳුනාගැනීම තුළින් එමගින් රටේ ජාතික නිෂ්පාදිතයට ලැබෙන දායකත්වය හා එම ව්‍යාපාරවල සම්පත් භාවිතය වැනි දත්ත වෙන්කර ලබා ගැනීමට හැකි වනු ඇත. ඊට අමතරව එම ව්‍යාපාර සම්බන්ධයෙන් රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීම, විවිධ ආයතන ලබා දෙන පහසුකම් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වලට ගලායාමට සැලැස්වීම, රැකියා අවස්ථා හඳුනා ගැනීම වැනි හේතු සඳහා ද රටක පවතින ව්‍යාපාර අතරින් සුළු හා මධ්‍ය පරිමණ ව්‍යාපාර වෙනකර හඳුනා ගත යුතුය. **(ලකුණු 02)**

03. i. අ) අනාගත මුදල් ගෙවීමක් සඳහා වර්තමානයේ ගිවිස ගැනීම එනම් ඉදිරි දිනක දී මුදල් ගෙවීමේ කොන්දේසි යටතේ භාණ්ඩ හා සේවා මිල දී ගත හැකි වීම, විලම්භිත ගෙවීම් මාධ්‍යයක් ලෙස කටයුතු කිරීමේ කාර්යය ඉටු කරනු ලබයි.

උදාහාරණ:- මාලික මිළදී ගත් දුරකථනය සඳහා අඩක් එම අවස්ථාවේම ගෙවූ අතර ඉතිරි මුදල වාරික 5 කින් ගෙවීමට එකඟ විය. **(ලකුණු 02)**

ආ) <u>පහසුකම්</u>

1. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM)
2. ස්වයංක්‍රීය තැන්පතු (ADM)
3. චෙක්පත් තැන්පතු යන්ත්‍ර (CDM)
4. ටෙලි බැංකු පහසුකම්
5. අන්තර්ජාල බැංකු පහසුකම්
6. ටෙලිවිෂන් බැංකු පහසුකම්
7. වෙළෙඳසැල් ගෙවීම් විද්‍යුත් පැවරුම් ජාල (EFTPOS)

**(නම් කිරීමට ලකුණු 01)**

**(පහසුකම් දෙකක් පැහැදිළි කිරීමට ලකුණු 01)**

ii. අ) <u>ක්ෂේත්‍ර</u>

1. සාමාන්‍ය කොටස්
2. ණයකර
3. භාණ්ඩාගාර බිල්පත්
4. භාණ්ඩාගාර බැඳුම්කර
5. ස්ථාවර තැන්පතු

**(04 ක් සඳහා ලකුණු 01) (02 ක් සඳහා ලකුණු $\frac{1}{2}$) (02 ට අඩු නම් ලකුණු නැත)**

<u>ප්‍රතිලාභ</u>

1. ආයෝජන අවදානම අඩු වීම.
2. වෘත්තීය කළමනාකරුවන්ගේ සේවය ලබා ගත හැකි වීම.
3. බදු සහන ලබා ගත හැකි වීම.
4. මහා පරිමාණ ව්‍යාපාරවල ආයෝජනය කර ඉහළ ප්‍රතිලාභ ලැබිය හැකි වීම.

**(04 ක් සඳහා ලකුණු 01) (02 ක් සඳහා ලකුණු $\frac{1}{2}$) (02 ට අඩු නම් ලකුණු නැත)**

ආ) <u>පහසුකම්</u>

1. ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය (SLIPS)
2. ජගත් අන්තර් බැංකු මූල්‍ය විද්‍යුත් සන්නිවේදන ජාලය (SWIFT)
3. තත්කාලීන දළ පියවීම් පද්ධතිය (RTGS)
4. ලේඛන රහිත සුරැකුම් තැන්පතු පද්ධතිය (SSDS) **(ලකුණු 01)**

<u>වාසි</u>

1. ආයෝජන පිළිබඳ පූර්ණ සුරක්ෂිතතාව ඇති වීම.
2. මූල්‍ය ගණුදෙනු පහසුවීම.
3. ව්‍යාපාර කටයුතු කාර්යක්ෂම වීම.
4. ව්‍යාපාර පැවැත්ම තහවුරු වීම. **(ලකුණු 01)**

iii.
- අදාළ බැංකුවේ වෙබ් අඩවියේ Online Banking වෙත පිවිස හෝ Mobile App එකට පිවිසීම.
- User Name හා මුරපදය යොදා අවශ්‍ය සේවා තෝරා ගැනීම.
- මුදල් හුවමාරුව යටතේ දේශීය මුදල් හුවමාරුව තෝරා ගැනීම.
- මුදල් හර වන ගිණුම තෝරා ගැනීම.
- මුදල් බැර වෙන ගිණුම තෝරා ගැනීම.
- මුදල් ප්‍රමාණය ඇතුළත් කර ගෙවීම තහවුරු කිරීම.
- ගෙවන්නාගේ මුරපදය සනාථ කිරීම.
- දෙපාර්ශවයටම කෙටි පණිවුඩයක් ලැබීම. **(පියවර 04 ක් සඳහා ලකුණු 04)**

**(බැංකු අනුව පපියවර වෙනස් විය හැකිය.)**

iv. අ) රක්ෂණ සමාගම් දෙකෙන්ම වන්දි ලබා ගගත නොහැකිය. රක්ෂණය තුළින් සෑම විටම රක්ෂිතයාට ලාභ ලැබීම වලක්වන බැවින්, හානි පූරණය, දායකත්වය යන මූලධර්ම වලට අනුව රක්ෂණ සමාගම් දෙකෙන්ම මුළු අලාභය අනුපාතිකව දායක වේ. **(ලකුණු 02)**

ආ)

| | | | |
|---|---|---|---|
| 1. | කැරලි කෝලහාල | 2. | ජල ගැලීම්, සුළිසුළං, කුණාටු |
| 3. | පිපිරීම් හානි | 4. | විදුලිය ආපදා හානි |
| 5. | භූමි කම්පා/ සුනාමි | 6. | ගැටීම් හානි |
| 7. | ගුවන් යානා හානි | 8. | ආනුශංගික අලාභ හානි |

**(ලකුණු $\frac{1}{2}$x4=02)**

v. අ)
1. පරිසරයේ ඇති වන බාධා
2. සමාජ හා සංස්කෘතික ගැටළු
3. මාධ්‍යවල අකර්මන්‍යතා
4. උපකරණ භාවිතා කිරීමට ඇති දැනුම පිළිබඳ බාධා
5. පණිවුඩය යවන්නා හා ලබන්නා තුළ ඇති දුර්වලතා
6. උපකරණවල හා විදුලිය ඇනහිටීම් ආදියේ ඇති විය හැකි බාධා
7. සන්නිවේදන පද්ධතිවල දුර්වලතා **(ලකුණු $\frac{1}{2}$x4=02)**

ආ)
1. වේගවත් බව හා ක්ෂණිකව යැවිය හැකි වීම.
2. පුළුල් ලෙස පැතිරුණ පාලනයක් වීම.
3. පිරිවැය අඩු වීම.
4. ගබඩාකර තැබිය හැකි වීම නිසා ඕනෑම අවස්ථාවක ලබාගත හැකි වීම.
5. ඕනෑම ස්ථානයකින් සන්නිවේදනය කළ හැකි වීම.
6. විශාල තොරතුරු ප්‍රමාණයක් එක්වර යැවිය හැකි වීම.
7. ලිපිද්‍රව්‍ය භාවිතය අවම වීම.
8. පණිවුඩය යැවූ බව හා ලද බව ක්ෂණිකව තහවුරු වීම. **(ලකුණු $\frac{1}{2}$x4=02)**

04\. i. අ) 1. එක් රැස් කර ගැනීමේ හා ඒ ඒ ස්ථාන වලට ගෙනයාමේ හැකියාව.
2. තම පුද්ගලික වාහන වුවද භාවිතා කළ හැකි වීම.
3. ඕනෑම වේලාවක එම ප්‍රවාහන මාධ්‍යය භාවිතා කළහැකි වීම.
4. දිවයින පුරා ව්‍යාප්තව තිබීම.
5. කඩින් කඩ ප්‍රවාහනයට සුදුසු වීම.
6. දුම්රිය ප්‍රමාදයන් සිදුවන බැවින් එළවළු හා පළතුරු නරක් විය හැකි වීම. **(ලකුණු $\frac{1}{2}$x4=02)**

ආ) 1. බලය - පෙට්‍රල්, ඩීසල්, ගල් අඟුරු, වාෂ්ප, විදුලිය
2. මාර්ගය - මහා මාර්ග, දුම්රිය මාර්ග, ගුවන් මාර්ග
3. මාධ්‍යය - බස්, ලොරි, දුම්රිය, නැව්, ගුවන් යානා
4. පර්යන්තය - බස් නැවතුම්පොළ, දුම්රිය ස්ථානය, වරාය, ගුවන්තොටුපළ

**(ලකුණු $\frac{1}{2}$x4=02)**

**(මූලිකාංග හතර පමණක් ලියා ඇත්නම් ලකුණු 01)**

ii. 1. නිෂ්පාදන ක්‍රියාවලිය දක්වා වූ පද්ධතිය
2. සමබර වූ ප්‍රවාහනය හා සැපයුම් පද්ධති
3. නිෂ්පාදනයෙන් පසු පාරිභෝගිකයා අතට පත් කිරීමේ පද්ධතිය
4. නිෂ්පාදන අලෙවියෙන් පසු ආපසු ප්‍රවාහනය සඳහා වූ සැපයුම් පද්ධති **(ලකුණු 04)**

iii. අ) <u>වාසි</u>

1. තම කාලය මුළුමනින්ම නිෂ්පාදනයට යොදා ගත හැකි වීම.
2. අතරමැදියන් විශේෂඥ දැනුමෙන් ප්‍රයෝජන ගත හැකි වීම.
3. ආයතනයේ පිරිවැටුම වැඩි වීම.

<u>අවාසි</u>

1. භාණ්ඩ මිල ඉහළ යාම නිසා ඉල්ලුම අඩු වී අලෙවිය පහළ යාම.
2. අතරමැදියා භාණ්ඩ වල ස්වරූපය වෙනස් කිරීමට හැකියාව ඇත.
3. නිෂ්පාදකයාට වෙළෙඳපොළ පාලනයට ඇති බලය අඩු වීම. **(ලකුණු $\frac{1}{2}$x4=02)**

ආ) 1. රැකී රක්ෂා අවස්ථා රටතුල නිර්මාණය වීම.
2. විදේශ කටයුතු පුළුල් වීම.
3. විදේශ විනිමය ප්‍රමාණයන් රට තුලට ගලා ඒම.
4. රටතුල යටිතල පහසුකම් සංවර්ධනයට මග පෑදීම.
5. රටතුල යම් කර්මාන්ත ප්‍රමාණයක් බිහි වීම.
6. ජාතික ආදායම ඉහළ යාම. **(ලකුණු $\frac{1}{2}$x4=02)**

iv. අ) 1. ගණුදෙනුකරුවන්ගේ පක්ෂපාතීත්වය ලබා ගැනීම.
2. වෙළෙඳසැල් නවීකරණය කිරීම.
3. පාරිභෝගික ප්‍රවර්ධන ක්‍රම වැඩි දියුණු කිරීම.
4. ස්වයං සේවා ක්‍රමය ක්‍රියාත්මක කිරීම.
5. ව්‍යාපාර ස්ථානය තුල සිත් ඇදගන්නා ලෙස භාණ්ඩ ප්‍රදර්ශනය කිරීම.
6. මිල අඩු කිරීම මගින් තරඟයට මුහුණ දීම.

**(වෙනත් ගැලපෙන පිළිතුරු වලට ලකුණු ලබා දෙන්න.)** **(ලකුණු $\frac{1}{2}$x4=02)**

ආ) 1. සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගත හැකි වීම.
2. විදේශ විනිමය ඉපයිය හැකි අවස්ථා ඇති වීම.
3. ගුණත්වයෙන් උසස් භාණ්ඩ පරිභෝජනයට අවස්ථාව සැලසීම.
4. තාක්ෂණික දැනුම ලබා ගැනීමට හැකි වීම.
5. සාපේක්ෂ පිරිවැය වාසි ලබා ගැනීමට හැකි වීම.
6. රටවල් අතර සම්පත් බෙදීයාමේ විෂමතාවන් පවතින නිසා. **(ලකුණු $\frac{1}{2}$x4=02)**

v. 1. <u>නෞභාරපත</u>

නැව් සමාගමක් වෙනුවෙන් නැව්පති හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් අපනයනකරු වෙත නිකුත් කරේ. භාණ්ඩ තොගය නැවට භාරගත් බවටත් එම තොගය අදාළ රටේ වරායට ගෙන ගොස් භාර දෙන බවටත් නැව් සමාගම පොරොන්දු වෙමින් නිකුත් කරන ලියවිල්ලයි.
ආනයනකරුට එම භාණ්ඩ වල අයිතිය තහවුරු කිරීමට මෙය අවශ්‍ය වේ. **(ලකුණු 01)**

2. <u>අපනයන සටහන්කරය</u>

ආනයනනරු වෙනුවෙන් වරායට ලැබී ඇති භාණ්ඩ පිළිබඳ අයිතිය ප්‍රකාශ කිරීම සඳහා ආනයනකරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් රේගුව වෙත ඉදිරිපත් කළ යුතු ලියවිල්ලයි. නෞභාරපත හෝ ඉන්වොයිසිය ඇසුරෙන් මෙය පිළියෙළ කෙරේ. **(ලකුණු 01)**

3. <u>ණයවර ලිපිය</u>

ආනයන අපනයන වෙළෙඳාමේදී අපනයනකරුට මුදල් ගෙවීම සඳහා බහුලව භාවිතා කෙරෙන මාධ්‍යයකි. ආනයනකරුගේ ඉල්ලීම මත ආනයනකරු වෙනුවෙන් ඔහුගේ බැංකුව විසින් අපනයනකරුගේ බැංකුව වෙත ණයවර ලිපිය නිකුත් කෙරෙයි. අපනයනකරු විසින් ආනයනකරුවෙකු වෙත අපනයනය කරනු ලබන භාණ්ඩ වලට මුදල් ගෙවීම තහවුරු කිරීම සඳහා ආනයනකරුගේ බැංකුව නිකුත් කරන ලියවිල්ලකි. **(ලකුණු 01)**

4. <u>ප්‍රභවස්ථාන සහතිකය</u>

නැව්ගත කරන භාණ්ඩ අපනයනය කරන රටේ නිපදවා ඇති බව සහතික කරමින් පිළිගත් වෙළෙඳ මණ්ඩලයකින් හෝ රාජ්‍ය ආයතනයකින් නිකුත් කරනු ලබන ලියවිල්ලකි. තීරුබදු සහන ලබා ගැනීමේදී මෙම ලියවිල්ල වැදගත් වේ. **(ලකුණු 01)**

## <u>"ආ" කොටස</u>

05. i. අ) කළමනාකරණය යනු ගතික ව්‍යාපාර පරිසරය තුළ සංවිධානයක ප්‍රකාශිත පරමාර්ථ හා අරමුණු සඵලදායීව ඉටු කර ගැනීම සඳහා සංවිධානය සතු සම්පත් කාර්යක්ෂමතාවෙන් යුතුව සැලසුම්කරණය, සවිධානකරණය, මෙහෙයවීම හා පාලනය යන කාර්යය ඇතුළත් ඵලදායී ක්‍රියාවලියකි. **(ලකුණු 01)**

ආ) <u>සඵලදායකත්වය</u>

ආයතනයක් විසින් කොතෙක් දුරට අපේක්ෂිත අරමුණු නිවැරදිව ළඟා කර ගනු ලබන්නේ ද යන්න සඵලදායකත්වය ලෙස හැඳින්වේ. එනම් නිවැරදි තේරීමයි. නැතිනම් නිවැරදි දෙය කිරීමයි. **(ලකුණු 01)**

<u>කාර්යක්ෂමතාවය</u>

අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමේදී අවම සම්පත් ප්‍රමාණයක් භාවිතා කර උපරිම නිමවුමක් ළඟා කර ගැනීම කාර්යක්ෂමතාව ලෙස හැඳින්වේ. එනම් කළ යුතු කාර්යය නිවැරරදිව කිරීමයි. **(ලකුණු 01)**

<u>ඵලදායකත්වය</u>

නියමිත කාලය තුළ ආයතනයක නිමවුම් හා යෙදවුම් අතර පවතින අනුපාතික සබඳතාව ඵලදායකත්වය වේ. **(ලකුණු 01)**

ii. 1. <u>අලුතින් ලොරියක් මිලදී ගැනීමේ වාසි</u>

1. තමා සතුව නව වත්කමක් ඇති වීම.
2. අනාගතයේ දී එම ලොරිය විකුණා මුදල් ලබා ගත හැකි වීම.
3. වෙනත් ව්‍යාපාර කටයුත්තක් සඳහා වුවද යොදා ගත හැකි වීම. **(ලකුණු $\frac{1}{2}$x2=01)**

<u>අලුතින් ලොරියක් මිලදී ගැනීමේ අවාසි</u>

1. එකවර විශාල මුදලක් ප්‍රමාණයක් වැය කිරීමට සිදු වීම.
2. නඩත්තු වියදම් දැරීමට සිදු වීම.
3. මෙම ව්‍යාපාර අවස්ථාව කෙටි කාලීන විය හැකි නිසා අළුතින් ලොරියක් මිලදී ගැනීම මුදල් නාස්තියක් වේ. **(ලකුණු $\frac{1}{2}$x2=01)**

2. <u>කුලී පදනමට ලොරියක් ලබා ගැනීමේ වාසි</u>

1. නඩත්තු වියදම් විශාල වශයෙන් දැරීමට සිදු නොවීම.
2. එකවර විශාල මුදලක් දැරීමට සිදු නොවීම.
3. කෙටි කාලීන ව්‍යාපාර අවස්ථාවක් වන බැවින් කුලී පදනම මත ලොරියක් ලබා ගැනීම වඩාත් ඵලදායී විය හැකි වීම. **(ලකුණු $\frac{1}{2}$x2=01)**

<u>කුලී පදනමට ලොරියක් ලබා ගැනීමේ අවාසි</u>

1. ව්‍යාපාරය ලාභ ලැබුවත් නොලැබුවත් කුලිය ගෙවීමට සිදු වීම.
2. මෙම ව්‍යාපාර අවස්ථාව සලකා බැලීමේ දී ව්‍යාපාරය දෛනිකව කළ හැකි ද යන්න අවදානමක් පවතින බැවින් ලොරි රථය සඳහා කුලී ගෙවීමට සිදු වීම.

**(ලකුණු $\frac{1}{2}$x2=01)**

iii. 1. පැහැදිළිව නිශ්චය කරගත් අරමුණු හා පරමාර්ථ මත පදනම් වීම.
2. නිශ්චිත කාල සීමාවක් සඳහා සීමා වීම.
3. ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි වීම.
4. නම්‍යශීලි වීම.
5. ආයතනයේ සෑම මට්ටමකම සේවකයන්ට තේරුම් ගත හැකි වීම.
6. සෙසු කළමනාකරණ කාර්යන්ට කලින් සකස් කළ යුතු වීම හා එම කාර්යයන් සම්බන්ධ වන ආකාරය සකස් කළ යුතු වීම.
7. සෑම මට්ටමකම කළමනාකරුවන් කැපවීම හා සහභාගීත්වය අවශ්‍ය වීම.
8. කාර්යක්ෂමතාව රැකිය යුතු වීම. **(ලකුණු 04)**

iv. අ) 1. සේවකයන් පුහුණු කිරීම.
2. උසස් වීම් ලබා දීම.
3. රැකියා සුරක්ෂිත බව ඇති කිරීම.
4. යෝග්‍ය වැඩ පරිසරයක් ඇති කිරීම හා නවීන උපකරණ සැපයීම.
5. සෞඛ්‍ය පහසුකම්, නිවාස, ආහාර පාන හා නිල ඇඳුම් ලබා දීම.
6. සේවකයන් ඇගයීම.
7. සම්මාන පිරිනැමීම.
8. සේවක සවිබල ගැන්වීම.

**(ලකුණු $\frac{1}{2}$x4=02)**

ආ)

| | | | |
|---|---|---|---|
| 1. | ප්‍රියජනක බව | 2. | උසස් පෞරුෂත්ව ලක්ෂණ |
| 3. | බුද්ධිමත් බව | 4. | ආත්ම විශ්වාසය |
| 5. | කායික හා මානසික නිරෝගී බව | 6. | ස්වයං විනය |
| 7. | අධිෂ්ඨානය | 8. | කැපවීම |

**(ලකුණු $\frac{1}{2}$x4=02)**

v. අ) <u>මධ්‍යගතකරණයේ වාසි</u>

| | | | |
|---|---|---|---|
| 1. | තීරණ ගැනීම වේගවත්ය. | 2. | තීරණවල ඒකීයත්වයක් පැවතීම. |
| 3. | පාලන කාර්යය පහසු වීම. | 4. | සන්නිවේදනය පහසු වීම. |
| 5. | පිරිවැය අඩු වීම. | | |

**(ලකුණු $\frac{1}{2}$x2=01)**

<u>විමධ්‍යගතකරණයේ වාසි</u>

1. ඉහළ කළමනාකරණයේ කාර්යභාරය අඩු වීම.
2. ගුණාත්මක තීරණ ගත හැකි වීම.
3. පහසුවෙන් තීරණ ක්‍රියාවට නැංවිය හැකි වීම.
4. යටත් සේවකයන් සංවර්ධනය වීම.
5. සේවක අභිප්‍රේරණය ඉහළ යාම හා තෘප්තිය වර්ධනය වීම.

**(ලකුණු $\frac{1}{2}$x2=01)**

ආ)

| | | | |
|---|---|---|---|
| 1. | ප්‍රමිති ස්ථාපිත කිරීම. | 2. | කාර්යඵල මැනීම. |
| 3. | විචල්‍ය හඳුනාගැනීම. | 4. | ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග ගැනීම. |

**(අනුපිළිවෙලින් තිබීම අවශ්‍ය වේ.) (ලකුණු $\frac{1}{2}$x2=01)**

06. i. ආ) නිශ්චිත භාණ්ඩ හා සේවා ප්‍රමාණයක් නිපදවීමට ආයතනයකට ඇති හැකියාව නැතහොත් නිශ්චිත කාලයක් තුළ නිපදවිය හැකි උපරිම ඒකක ප්‍රමාණය වේ. **(ලකුණු 02)**

ආ) 1. නිෂ්පාදන ප්‍රමාණය 2. පොරොත්තු කාලය
3. නිෂ්පාදන ක්‍රියාවලියේ ස්වභාවය 4. තොග සම්බන්ධ ඇරීමට සිදු වන පිරිවැය

**(ලකුණු $\frac{1}{2}$x4=02)**

ii. අ) ස්ථාවර වෙනස් නොවන පිරිවැය
උදාහරණ:- 1. රක්‍ෂණ ගාස්තු 2. ගොඩනැගිලි ක්‍ෂය
3. කම්හල් කුලී 4. කම්හල් වරිපනම්

**(ලකුණු $\frac{1}{2}$x2=01)**

විචල්‍ය පිරිවැය
උදාහරණ:- 1. කම්හල් සෘජු ද්‍රව්‍ය පිරිවැය 2. සෘජු ශ්‍රම පිරිවැය
3. කම්හල් පිරිවැය 4. කැලී වැටුප්
5. විකුණුම් ඒකක මත කොමිස්

**(ලකුණු $\frac{1}{2}$x2=01)**

ආ) භාණ්ඩයක විකුණුම් මිලෙන් විචල්‍ය පිරිවැය අඩු කිරීමෙන් ලැබෙන අගය සහභාගය ලෙස හැඳින්විය හැකිය. මෙයට දායකය යන නමද භාවිතා කරයි. සහභාගයේ වැදගත්කම වන්නේ මේ මඟින් ආයතනයේ ස්ථාවර පිරිවැය හා ලාභය ආවරණය කර ගැනීමට හැකි වීමයි. **(ලකුණු 02)**

iii. එකඟ නොවේ. **(ලකුණු 01)**

සමච්ඡේද ලක්‍ෂය යනු ව්‍යාපාරයක් ලාභ හෝ අලාභ නොලබන නිෂ්පාදන හෝ අලෙවි මට්ටමයි. ඒ අනුව ව්‍යාපාර ආයතනයක ලාභ ලැබීම ආරම්භ වන නිෂ්පාදන මට්ටම හෝ විකුණුම් මට්ටම හඳුනා ගැනීම සමච්ඡේද ලක්‍ෂය ගණනය කිරීමෙන් දැන ගත හැකි වේ. එය එහි එක් ප්‍රතිලාභයක් පමණි. ඊට අමතරව ව්‍යාපාර කටයුතු සැලසුම් කිරීම සඳහා පිරිවැය, ලාභය හා පරිමාව පාලනය කිරීමේ උපකරණයක් ලෙස භාවිත කළ හැකි වීමත්, මිල නියම කිරීමේදී යොදා ගත හැකි වීමත් වැනි ප්‍රතිලාභ රැසක් සම්ච්ඡේද ලක්‍ෂය ගණනයෙන් අත්කර ගත හැකි ප්‍රතිලාභ වේ. **(ලකුණු 03)**

iv. අ) යලි ඇනවුම් මට්ටම = උපරිම තොග භාවිතය x උපරිම ඇනවුම් කාලය
= 80 x 16
= 1280 ඒකක **(ලකුණු 02)**

ආ) උපරිම තොග මට්ටම = යලි ඇනවුම් මට්ටම - (අවම තොග භාවිතය x අවම ඇනවුම් කාලය) + යලි ඇනවුම් ප්‍රමාණය
= 1280 - (30 x 8) + 4000
= 5040 ඒකක **(ලකුණු 02)**

v. අ) වටිනාකම හා තෘප්තිය
පිරිනැමුම් (නිෂ්පාදිත) හා සන්නම් **(ලකුණු 02)**

ආ) <u>වටිනාකම</u>

පාරිභෝගික අවශ්‍යතා ඉටුකර ගැනීමට තිබෙන හැකියාව පිළිබඳ පාරිභෝගිකයා විසින් සිදු කරනු ලබන සමස්ත තක්සේරුව වටිනාකමයි. වටිනාකම නිෂ්පාදිතයෙන් ලැබෙන ප්‍රතිලාභය හා ඒ සඳහා දරණ පිරිවැය අතර අනුපාතයයි.

<u>තෘප්තිය</u>

පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා හා වුවමනා සපුරාලන පරිදි නිෂ්පාදිතයක් බිහි කිරීම තුළින් පාරිභෝගිකයා අත්පත් කර ගනු ලබන සතුට තෘප්තියයි.

<u>පිරිනැමුම් හා සන්නම්</u>

ව්‍යාපාරිකයන් විසින් ගණුදෙනුකරුවකුගේ අවශ්‍යතා තෘප්තිමත් කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන වටිනාකම් සමූහය පිරිනැමුම් ලෙස හැඳින්වේ. නිෂ්පාදිත සැපයීමෙන් මෙය ඉටු කරනු ලබයි.

සන්නම යනු තරඟකාරී නිෂ්පාදිත අතරින් තම නිෂ්පාදිත වෙන්කර හඳුනාගැනීම සඳහා භාවිතා කරන අක්ෂර කාණ්ඩ හෝ ලාංඡනයක් හෝ ඒවායේ සංකලනයකි. **(ලකුණු 02)**

07\. i. අ) - භූගෝලීය සාධක - ප්‍රජා විද්‍යාත්මක සාධක
- මනෝ විද්‍යාත්මක සාධක - චර්යාත්මක සාධක **(ලකුණු $\frac{1}{2}$x4=02)**

ආ) 1. සමස්ථ වෙළඳපොළම විශ්ලේෂණයට භාජනය කෙරෙන නිසා වෙළඳපොල පිළිබඳව හොඳ අවබෝධයක් ලබා ගත හැකි වීම.
2. උචිත හා කාලීන වෙළඳපොල අවස්ථා හඳුනාගත හැකිවීම.
3. ආයතනය සතු සීමිත සම්පත් ඵලදායී හා කාර්යක්‍ෂම ලෙස යොදා ගැනීමට හැකි වීම.
4. ආයතනයට වෙළඳපොළ පිළිබඳ ඇති අවධානම අවම කර ගත හැකි වීම.
5. අලෙවි කරන වැඩසටහන් වඩාත් සාර්ථකව ක්‍රියාත්මක කළ හැකි වීම. **(ලකුණු $\frac{1}{2}$x4=02)**

ii. පළල - ආයතන සතු නිෂ්පාදන පෙළවල් ගණන
දිග - සියලුම භාණ්ඩ පෙළවල අන්තර්ගත නිෂ්පාදිත ගණන
ගැඹුර - එක නිෂ්පාදිත වර්ගයක් යටතේ ඉදිරිපත් කරන අයිතම සංඛ්‍යාව
සංගතභාවය - භාණ්ඩ වර්ග අතර ඇති සම්බන්ධතාවය **(ලකුණු 1x4=04)**

iii. අ) 1. අනෙකුත් තරඟකාරී සන්නම් වලින් තම ආයතනයේ සන්නම වෙන්කර හඳුනාගත හැකි වීම මගින් අනන්‍යතා රැක ගත හැකිවීම
2. ඇනවුම් ලබා ගැනීමේදී පහසුව
3. නෛතික ආරක්‍ෂාවක් ලැබීම
4. භාණ්ඩයේ විශේෂ ගුණයක් පිළිබඳ පාරිභෝගික විශ්වාසය තහවුරු කර ගැනීම
5. පාරිභෝගිකයන් අතර සන්නම් පක්‍ෂපාතීත්වය ඇති කර ගත හැකි වීම

**(ලකුණු $\frac{1}{2}$x4=02)**

ආ) ප්‍රාථමික ඇසුරුම
ද්විතීයික ඇසුරුම
ප්‍රවාහන ඇසුරුම

**(ලකුණු $\frac{1}{2}$)**

ප්‍රාථමික ඇසුරුම - භාණ්ඩයක ප්‍රථම ඇසුරුම ප්‍රාථමික ඇසුරුමයි.
උදා : කිරිපිටි බහා ඇති පොලිතීන් ඇසුරුම
දන්තාලේපන ටියුබය **(ලකුණු $\frac{1}{2}$)**

ද්විතීයික ඇසුරුම - ප්‍රාථමික ඇසුරුමට පිටතින් ඇති වෙනත් ඇසුරුමක් ද්විතීයික ඇසුරුමක් වේ.
උදා : කිරිපිටි ඇතුලත් පොලිතීන් ඇසුරුම බහා ඇති කාඩ්බෝඩ් පෙට්ටිය
දන්තාලේපන ටියුබය බහාලන පෙට්ටිය **(ලකුණු $\frac{1}{2}$)**

ප්‍රවාහන ඇසුරුම - ප්‍රාථමික හා ද්වීතියික ඇසුරුම් සහිත නිෂ්පාදිත තොගයක් ප්‍රවාහනය කිරීමේ දී භාවිතා කරන විශාල බහාලුම ප්‍රවාහන ඇසුරුමයි
**(ලකුණු $\frac{1}{2}$)**

iv. අ) භාණ්ඩාගාර බිල්පත් ඵලදායී ආයෝජනය මාර්ගයකි.එසේම ඉහළ ද්‍රවශීලතාවයක් ද පවතී. එය එසේ වීමට බලපාන එක් හේතුවක් පමණි. ඊට අමතරව අවධානම් රහිත ආයෝජනයක් වීම, ඉපැයීම ඉහළ අගයක් ගැනීම, බහුවිධි කල්පිරීම් සහිත වීම නිර්ලේඛිත සුරැකුම්පත් පියවීම් පහසුකම් ලැබීම ආදිය නිසා භාණ්ඩාගාර බිල්පත් ඵලදායී ආයෝජන මාර්ගයක් ලෙස සැලකිය හැකිය.
**(ලකුණු 02)**

ආ)
- සාංගමික ණයකර
- කොටස් බලපත්‍ර
- වරණීය කොටස්
- රජයේ සුරැකුම්පත් **(ලකුණු 02)**

v. අ) ණයකර, සාමාන්‍ය කොටස් හා වරණීය කොටස් **(ලකුණු 02)**

ආ) දළ කාරක ප්‍රාග්ධනය = බඩු තොගය 60 000
ණයගැතියෝ 15 000
මුදල් ශේෂය 23 000
රු. 98 000

ශුද්ධ කාරක ප්‍රාග්ධනය = 98 000 - (ණයහිමියෝ + ගෙවිය යුතු වියදම්)
= 98 000 (50 000 + 20 000)
= 98 000 - 70 000
= රු. 28 000 **(ලකුණු 02)**

08. i. අ) කෙටි කාලීන ආයෝජන තීරණ -
- තොග මිළ දී ගැනීම
- ණය ආපසු අයකර ගැනීමේ කාලය අඩු කිරීම
- සුළු මුදල් අග්‍රීමය වැඩි කිරීම

දිගු කාලීන ආයෝජන තීරණ -
- රථවාහන අංගනයක් ඉදිකිරීම
- නව දුරකථන පද්ධතියක් ස්ථාපිත කිරීම
- නව ව්‍යාපාර ශාඛාවක් විවෘත කිරීම **(ලකුණු 02)**

ආ) ආයෝජනයේ ප්‍රතිලාභ හා ආයෝජනයේ අවධානම (පැහැදිළි කිරීම අවශ්‍යයි) **(ලකුණු 02)**

ii. අ) වාසි - අමතර පිරිවැයක් දැරීමට සිදුනොවීම
කොන්දේසි වලට යටත් වීමට සිදු නොවීම
කවර හෝ විටක සපයා ගත හැකි වීම

සීමා - ලාභාංශ පොළී ගෙවීමට සිදුවීම
ව්‍යාපාරයෙන් මූල්‍ය පිටතට ඇදී යාම **(ලකුණු 02)**

ආ)
- අවශ්‍ය අරමුදල් ප්‍රමාණය
- අරමුදල් අවශ්‍ය වන කාලය
- පිරිවැය
- ව්‍යාපාරයේ ස්වභාවය
- තැබිය යුතු ඇප සුරැකුම්පත්
- ප්‍රාග්ධන ව්‍යුහයට වන බලපෑම
- අරමුදල් යොදවන ව්‍යාපෘතියේ ස්වභාවය හා ආවේනික ප්‍රතිලාභ
- කළමනාකරණයට සිදු වන බලපෑම **(ලකුණු 02)**

iii. අ) යම් නිශ්චිත අරමුණක් ඉටු කිරීම පිණිස සංවිධාන වැඩ ඒකකයක් වශයෙන් කටයුතු, රාජකාරී හා වගකීම් සකස් කිරීම රැකියා නිර්මාණය වේ. **(ලකුණු 02)**

ආ) අයදුම්පත් ඇගයීම
සම්මුඛ පරීක්ෂණ
ප්‍රායෝගික පරීක්ෂණ
බුද්ධි පරීක්ෂණ **(ලකුණු 02)**

iv. අ)
1. රැකියා දැන්වීම් පළ කිරීම
2. කුසලතා ඉන්වෙන්ට්‍රි / කුසලතා ලේඛන
3 අභ්‍යන්තර ජාලය
4. අභ්‍යන්තර සේවකයන් හඳුන්වා දීම
5. අනුප්‍රාප්ති සැලැස්ම **(ලකුණු 02)**

ආ)
1. ආයතනයේ සිටින සේවකයන්ගේ අභිප්‍රේරණයට බාධා ඇති වීම
2. ආකර්ෂණය සඳහා වන පිරිවැය ඉහළ යාම
3. ආකර්ෂණය සඳහා ගතවන කාලය අධික වීම
4. සේව්‍ය සේවක සබඳතාවලට අහිතකර ලෙස බලපෑ හැකි වීම **(ලකුණු 02)**

v. අ) 1. සාධාරණ වැටුපක් ලබා ගැනීම හා වර්ධනය
2. යහපත් වැඩ පරිසරයක් ලබා ගැනීම
3. වැඩ කරන කාලය පිළිබඳ ගැටලු විසඳා ගැනීම
4. වෘත්තීමය සෞඛ්‍ය හා වෘත්තීමය අනතුරුවලින් ආරක්ෂාව සලසා ගැනීම
5. රැකියා සුරක්ෂිතතාවය ඇති කර ගැනීම
6. අධ්‍යාපනය හා පුහුණුව ලබා ගැනීම
7. සාමූහික කේවල් කිරීම **(ලකුණු 02)**

ආ) 1. ශ්‍රම පිරිවැටුම
2. සේවක ප්‍රවාසිතාව
3. ශ්‍රම ඵලදායීතාව

(ඉහත නිර්ණායක නිර්වචනය කර ගණනය කරන ආකාරය දක්වා ඇති පිළිතුරු වලට සම්පූර්ණ ලකුණු දෙන්න.) **(ලකුණු 02)**